# පරීක්ෂක වාර්තාව

**අදියර II විභාගය - 2023 ජනවාරි**

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ලකුණු 25 ක් සඳහා වූ වෙන් කළ වාස්තවික ප්‍රශ්න 14 කින් සමන්විත විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට වෙන් කළ මුළු ලකුණුවලින් ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු පිරිසක් ප්‍රශ්න අංක 1.10 සඳහා නිවැරදි උත්තරය ලිවීමට අපොහොසත් වූ බව පෙනී ගියේය. මුදල් විශුද්ධිකරණය යටතේ වන එකඟවීමේ විත්තිවාචකය කෙටියෙන් පැහැදිලි කිරීම ප්‍රශ්නය තුළින් අපේක්ෂා කොට තිබුණි. විෂය නිර්දේශය තුළ මෙන්ම ස්ව අධ්‍යයනය පාඩම් මාලා තුළ මෙම විෂය කොටස් අන්තර් ගත වුවද මෙම විෂය කොටස් පිළිබඳව සිසුන්ගේ දැනුමේ ඌනතා නිරීක්ෂණය විය.

ප්‍රශ්න අංක 1.10 සඳහාද බහුතරයක් සිසුන් දුර්වල ලෙස පිළිතුරු සපයා තිබුණි. එහිදී ගනුදෙනු කළ හැකි ලියවිල්ලක ලක්ෂණ පිළිබඳව ප්‍රශ්න කොට තිබූ අතර ඒ පිළිබඳව සිසුන්ගේ දැනුමේ පරිසාධනය අපේක්ෂිත මට්ටමේ නොමැති බව පිළිතුරු තුළින් අනාවරණය විය.

සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා වූ කාර්යය සාධනය සතුටුදායක වූ අතර එය අපේක්ෂකයන් බහුතරයකට තම සමත් ලකුණ කරා ළඟා වීමට දායක විය.

**A කොටස** සඳහා ලකුණු ලබා ගැනීම පිණිස අයදුම්කරුවන්ට සිවිල් නීතිය, අපරාධ නීතිය, භාණ්ඩ විකිණීමේ ආඥා පනත, වාණිජ නීතිය, අන්තර්ජාතික නීතිය, මුදල් විශුද්ධිකරණය පිළිබඳ නීතිය, ගනුදෙනු කළ හැකි ලියවිලි පිළිබඳ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳව හොඳ දැනුමක් තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයෙන් කුලී සින්නක්කර ගිවිසුම් පිළිබඳව සිසුන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. මෙය තරමක සරල ප්‍රශ්නයක් වූ අතර එබැවින් සියලුම අයදුම්කරුවන් පාහේ මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා තිබුණි.

කෙසේ වෙතත් කුලී සින්නක්කර ගිවිසුමකදී ගිවිසුමේ දක්වා ඇති පරිදි වත්කම කුලියට ගත් තැනැත්තා එකඟ වූ වාරික ගෙවිය යුතුය. එය වත්කම මිලදී ගන්නාගේ මූලික වගකීමයි. ගිවිසුම් කාලය තුළ ගිවිසුමේ සඳහන් සම්පූර්ණ වටිනාකම ගෙවීමෙන් පමණක් වත්කම කුලියට ගත් තැනැත්තාට එය මිලදී ගත හැකිය.

වාරික ගෙවීම පැහැර හැරීමකදී හෝ වත්කම කුලියට ගත් තැනැත්තා විසින් ගිවිසුම කඩ කිරීමක් සිදු වූ විට ගිවිසුම අවසන් කිරීමට වත්කමේ හිමිකරුට අයිතියක් ඇත. එසේම ඔහුට වත්කමේ සන්තකය නැවත ලබා ගැනීමටත් වත්කමට සිදුවූ හානියක් වේ නම් ඒ වෙනුවෙන් අලාභ අය කරගැනීමටත් අයිතියක් ඇත.

කෙසේවෙතත් ගැටලුව නිවැරදිව විශ්ලේෂණය කිරීමට සහ ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු දීමට අයදුම්කරුවන් සුළු පිරිසකට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

### (a) කොටස

ප්‍රශ්නයේ මෙම කොටස මඟින් අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය ඇති වීම පිළිබඳව ප්‍රශ්න කරන ලදී. බහුතරයක් සිසුන් ප්‍රශ්නයේ මෙම කොටස සඳහා උත්සහ දරා තිබුණත් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී තිබුණි. අපේක්ෂකයන් නියෝජ්‍යත්ව නීතියේ විවිධ සංකල්ප කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

අපරානුමැතිය මඟින් නියෝජ්‍යත්වය ඇති වීම සඳහා පහත කොන්දේසි සම්පූර්ණ විය යුතුයඃ

(1) නියෝජිතයා විසින් සිය ප්‍රධානියා පිළිබඳ හෙළිදරව් කරමින් ගිවිසුමට එළඹ තිබිය යුතුය.

(2) ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී ප්‍රධානියාට ගිවිසුම් ශක්නුතාවය පැවතිය යුතුය.

(3) ගිවිසුමට අදාළ සියලු වැදගත් කරුණු නියෝජිතයා විසින් ප්‍රධානියාට හෙළිදරව් කළ යුතුය.

(4) ප්‍රධානියා විසින් සම්පූර්ණ ගිවිසුමම අපරානුමත කළ යුතුයි. ගිවිසුමේ කොටසක් සඳහා පමණක් කරනු ලබන අපරානුමැතීන් වලංගු නොවේ.

(5) සාධාරණ කාලයක් ඇතුළත අපරානුමැතිය සිදු කළ යුතුයි.

(6) අපරානුමත කළ හැක්කේ නීත්‍යානුකූල ගිවිසුම් පමණි.

ඉහත කරුණු නිවැරදිව පෙළ ගැස්වීමට අයදුම්කරුවන්ට නොහැකි වූ බැවින් ඔවුන්ට සතුටුදායක ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

### (b) කොටස

ප්‍රශ්නයේ මෙම කොටස මඟින් අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය පිළිබඳව ප්‍රශ්න කරන ලදී. බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට නිවැරදි පිළිතුරු සපයා ඇත.

අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය ඇති වීම සඳහා පහත කොන්දේසි සම්පූර්ණ විය යුතුයඃ

(1) ප්‍රධානියාගෙන් උපදෙස් ලබා ගත නොහැකි තරමේ හදිසි අවශ්‍යතාවයක් උද්ගතව තිබිය යුතුය.

(2) එය සත්‍ය වාණිජමය අවශ්‍යතාවයක් විය යුතුය.

(3) නියෝජිතයා විසින් ප්‍රධානියා වෙනුවෙන් සද්භාවයෙන් ක්‍රියා කොට තිබිය යුතුය.

(4) නියෝජිතයා විසින් ගන්නා ලද පියවර සාධාරණ හා විචක්ෂණශීලි විය යුතුය.

(5) ප්‍රධානියා විසින් පටහැනි ආකාරයේ ප්‍රකාශිත උපදෙස් පූර්වයෙන් ලබා දී නොතිබිය යුතුයි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය මඟින් හවුල් ව්‍යාපාර නීතිය පිළිබඳව ප්‍රශ්න කොට තිබුණි. හවුල් ව්‍යාපාර නීතිය හා සම්බන්ධ තරමක් සරල ප්‍රශ්නයකි. හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව මෙන්ම අධිකරණය මඟින් හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරිය හැකි අවස්ථා ප්‍රශ්න කොට තිබුණි. සියලුම අයදුම්කරුවන් පාහේ ප්‍රශ්නයට උත්සහ දරා නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

කෙසේ නමුත් හවුල් ව්‍යාපාරයක් අධිකරණය මඟින් විසුරුවා හැරීම පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුමේ ඌනතාවයක් පෙනී යන ලදී.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

**(a) කොටස**

මෙම කොටස පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත මත පදනම් වී ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු ප්‍රශ්න කොට තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්නය සඳහා උත්සහ දරා නිවැරදි පිළිතුර සපයා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

**(b) හා (c) කොටස**

මෙම කොටස් පරිගණක අපරාධ පනත මත පදනම් විය. බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා උත්සහ දරා තිබුණද සපයා ඇති පිළිතුරු සතුටුදායක මට්ටමක නොවීය. අයදුම්කරුවන් කිහිපදෙනෙකු නිවැරදි පිළිතුරු සපයා තිබුණි. සිසුන් පරිගණක අපරාධ පනත පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් අත්කරගෙන නොමැති බව පෙනී යන්නට විය. පරිගණක අපරාධ පනත සිසුන් විසින් මැනවින් අධ්‍යයනය කල යුතුය.

පරිගණක අපරාධ පනත මඟින් පරිගණක අපරාධ අර්ථ නිරූපනය කිරීම හා ඒවා සම්බන්ධ විමර්ශනය කිරීමේ හා වැළැක්වීමේ ක්‍රියාපටිපාටීන් නිර්දේශ කරනු ලබයි.

පහත දැක්වෙන්නේ මෙම පනත යටතට ගැනෙන අපරාධ ක්‍රියා වේ.

(1) පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට සිදු කරනු ලබන අනවසර ප්‍රවේශය

(2) අපරාධයක් සිදු කිරීම සඳහා පරිගණකයට අනවසරයෙන් ඇතුළුවීම

(3) ඕනෑම පරිගණකයක ඇති ඕනෑම තොරතුරක් විනාශ කිරීම, මකා දැමීම හෝ වෙනස් කිරීම හෝ එකතු කිරීම, වෙනත් ස්ථානයකට ගෙන යාම හෝ වෙනස් කිරීම.

(4) හැකර් පද්ධති භාවිතයෙන් ප්‍රවේශ වීමට අවසර නොමැති මූලාශ්‍රවලින් දත්ත ලබා ගැනීම.

(5) පරිගණක මගින් සිදු කරන අපරාධවලට අනුබල දීම සහ කුමන්ත්‍රණය කිරීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය මගින් භාණ්ඩ විකිණීමේ අඥා පනත පිළිබඳ දැනුම පරීක්ෂා කොට තිබුණි. මෙය භාණ්ඩ විකිණීමේ අඥා පනත පිළිබඳව ප්‍රශ්න කරන ලද තරමක් සරල ප්‍රශ්නයක් ලෙස හඳුනාගත හැකිය. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්සහ දරා තිබූ අතර **(a) කොටස** සඳහා නිවැරදි පිළිතුරුද **(b) කොටස** සඳහා වැරදි පිළිතුරුද සපයා තිබුණි. සමස්තයක් වශයෙන් මෙම කොටස සඳහා පිළිතුරු දුර්වල මට්ටමක පැවතිණි.

**(a) කොටස** මගින් සම්බන්ධිත පාර්ශවයන්ගේ නෛතික අයිතීන් සාකච්ඡා කිරීම අපේක්ෂා කරන ලදී. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් **යශෝගේ** ගබඩාවේ සීනි තොග ගබඩා කර තබන ලද නිසා **දර්ශිට** සිදුවූ අලාභය **යශෝ** විසින් දැරිය යුතු බවට පිළිතරු සපයන ලද අතර එම පිළිතුර නිවැරදි නොවේ. භාණ්ඩවල අයිතිය **දර්ශි** වෙත මාරු වී ඇති බැවින් භාණ්ඩ **දර්ශි** වෙත ප්‍රවාහනය කරනු ලැබුවේද නැද්ද යන්න මෙහිදී වැදගත් නොවේ. **යශෝ** සිදු වූ අලාභය සඳහා වගකිව යුතු නොවේ.

**(b) කොටස** මගින් මිල නොලත් විකුණුම්කරුවෙකුට භාණ්ඩ නැවත විකිණීමට අවසර ඇති අවස්ථා මොනවාද යන්න ප්‍රශ්න කරයි. කෙසේනමුත් අයදුම්කරුවන්ට මෙම කොටස සම්බන්ධවද නිසි අවබෝධයක් නොමැති බව පෙනී යයි.

පහත අවස්ථාවලදී මිල නොලත් විකුණුම්කරුට භාණ්ඩ නැවත විකිණීමට අයිතියක් ඇතඃ

(1) එම භාණ්ඩ නශ්‍ය වන ස්වරූපයේ භාණ්ඩ වන විටක, උදා - එළවලු, මාලු, පළතුරු

(2) නැවත විකිණීමේ අයිතිය තබාගෙන භාණ්ඩ විකුණා ඇති විටෙක

(3) භාණ්ඩ නැවත විකුණනු ලබන බවට දැනුම් දීමෙන් පසුවද සාධාරණ කාලයක් ඇතුළත ගැනුම්කරු ප්‍රතිචාර දක්වා නොමැති විට.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## C කොටස

**ප්‍රශ්න අංක 07**

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය.

**(A) කොටස** ගිවිසුම් නීතිය මත පදනම් වී ඇත.

**(a)** මෙහිදී **කල්පනා මෙනවිය** හා **ගිනිකන මහතා** අතර වලංගු ගිවිසුමක් පවතීද යන්න ප්‍රශ්න ගත විය. සියලුම අයදුම්කරුවන් පාහේ මෙම කොටසට උත්සහ දරා තිබුණද දී ඇති සිද්ධිය අබබෝධකර ගැනීම පිළිබඳ යම් ව්‍යාකූලභාවයක් ඇතැම් අයදුම්කරුවන් තුළ පැවති බව පෙනී යයි. පාර්ශවයන් අතර වලංගු ගිවිසුමක් පැවතියද ඇතැම් අයදුම්කරුවන් එය නිවැරදිව හඳුනාගැනීමට අපොහොසත් විය.

**(b)** මෙහිදී **පොඩිමැණිකේ මහත්මිය** හා **ගිනිකන මහතා** අතර වලංගු ගිවිසුමක් පවතීද යන්න ප්‍රශ්න ගත විය. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් **පොඩිමැණිකේ මහත්මිය** විසින් යවන ලද තැපැල් පත ගිනිකන මහතා වෙත **කල්පනා මෙනවියගේ** ලිපියට පෙර ලැබී ඇති හෙයින් වලංගු ගිවිසුමක් පවතින බවට දක්වා තිබුණි.

සියලුම අයදුම්කරුවන් පාහේ මෙම කොටසට උත්සහ දරා තිබුණද දී ඇති සිද්ධිය අවබෝධකර ගැනීම පිළිබඳ යම් ව්‍යාකූලභාවයක් ඇතැම් අයදුම්කරුවන් තුළ පැවති බව පෙනී යයි. පාර්ශවයන් අතර වලංගු ගිවිසුමක් පැවතියද ඇතැම් අයදුම්කරුවන් එය නිවැරදිව හඳුනාගැනීමට අපොහොසත් විය. **පොඩිමැණිකේ මහත්මිය** හා **ගිනිකන මහතා** අතර වලංගු ගිවිසුමක් දැකිය නොහැකිය. අයදුම්කරුවන්ට වලංගු ගිවිසුමක මූලිකාංග පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බව පැහැදිලි විය.

**(c)** මෙහිදී **විල්ෆර්ඩ් මහතාගේ** නෛතික අයිතිවාසිකම් ප්‍රශ්න කොට තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් ගිනිකන මහතාගේ මෝටර් රථය විකිණීම සඳහා වන අර්පණය **කල්පනා මෙනවිය** විසින් පිළිගෙන ඇති බව හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව **විල්ෆර්ඩ් මහතාට** වන්දි ගෙවීමට **ගිනිකන මහතාට** සිදු වේ. මෙම ප්‍රශ්නය සඳහා කාර්යය සාධනය ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

**(B) කොටස** කම්කරු නීතිය මත පදනම් වී ඇත.

**(a)** අදාළ පරීක්ෂණයන් දක්වමින් සේවකයා හා ස්වාධීන කොන්ත්‍රාත්කරු අතර වෙනස පැහැදිලි කිරීම අවශ්‍ය විය. බොහෝ අයදුම්කරුවන් සතුටුදායක නොවන ආකාරයකට මෙම කොටස සඳහා පිළිතුරු සපයා තිබුණි. එසේම බොහෝ අයදුම්කරුවන් සේවකයා හා ස්වාධීන කොන්ත්‍රාත්කරු අතර වෙනස හඳුනා ගැනීමටද අපොහොසත් වී ඇත. ඉතාමත් සුලු අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් පාලනය පිළිබඳ පරීක්ෂණය, උපකරණ පිළිබඳ පරීක්ෂණය, ඒකාබද්ධ පරීක්ෂණය හා ආර්ථික සත්‍යතා පරීක්ෂණය අදාළ පරීක්ෂණ ලෙස දක්වා තිබුණි.

**(b)** මෙහිදී **සුරක්ෂාට** සේවකයෙකු ලෙස ඇගේ තනතුර ඉල්ලා සිටිය හැකිද යන්න ප්‍රශ්න ගත විය. සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු සාධනීය නොවීය. සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවකට මෙම කොටසට පිළිතුරු නිසි පරිදි සැපයීමට නොහැකි වූ අතර ඒ සඳහා හේතු වූයේ ස්වාධීන කොන්ත්‍රාත්කරු පිළිබඳව දැනුමේ ඌනතා පැවතීමයි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණුඃ</u>**

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුල භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යන පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -